2021 Dinamina and Silumina -buddeni -buddeni.k@thirdshift.lk -0771617186

ඉන්දියාවේ 75 වැනි නිදහස් සංවත්සරයට සිංහල මාධ්‍ය මාසික විද්වත් දේශන මාලාව අද

කොළඹ විශ්ව විද්‍යාලයේ සමකාලීන ඉන්දියානු අධ්‍යයන මධ්‍යස්ථානයේ (CCIS) 10 වැනි සංවත්සරය හා ඉන්දියාවේ 75 වැනි නිදහස් සංවත්සරය නිමිත්තෙන් සිංහල මාධ්‍ය මාසික විද්වත් දේශන මාලාව අද (27) පස්වරු 4.00ට කොළඹ විශ්ව විද්‍යාලීය පශ්චාද් උපාධි පීඨ සභාගාරයේදී ආරම්භ වේ.

'ඉන්දියානු සාහිත්‍යය පිළිබඳ විද්වත් කථිකාව' යන මැයෙන් ආරම්භ වන මේ දේශන මාලාවේ පළමු දේශනය ' ප්‍රාකෘත සාහිත්‍යයේ අලංකාරය' ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිංහල හා ජනසන්නිවේදන අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රත්නසිරි අරංගල විසින් පවත්වනු ලබයි.

කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රිකා එන්. විජයරත්න මහත්මියගේ සහ ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ආචාර්ය රේවන්ත් වික්‍රම් සිං ගේ ප්‍රධානත්වයෙන් මේ උත්සවය පැවැත්වේ.

මේ සඳහා උනන්දුවක් දක්වන ප්‍රේක්ෂකයන්ට Zoom, Facebook සහ YouTube හරහා ද මේ අවස්ථාවට සහභාගි විය හැකිය. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර අධ්‍යයන සබඳතා ශක්තිමත් කිරීමට CCIS හි සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උපුල් රංජිත් හේවාවිතාන ගමගේ (අධ්‍යක්ෂ, CCIS) ගේ මඟපෙන්වීම යටතේ මේ විද්වත් දේශන මාලාව සංවිධාන කර ඇත.

https://learn.zoom.us/j/62264916373?pwd=UWpKNXhjVEFCZWh4L1RWN2ltа3ZiUT09

Meeting ID: 622 6491 6373Passcode: B!5?LrQF මේ සූම් තාක්ෂණය ඔස්සේ මෙයට සම්බන්ධ විය හැකිය.

ජනපති මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමියන්ට
ජන්ම දින සුබ පැතුම් පුද කරයි

නාරාහේන්පිට අභයාරාමාධිපති, බස්නාහිර පළාත් ප්‍රධාන සංඝනායක, කොළඹ විශ්වවිද්‍යාලයේ කුලපති මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමියන්ට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ජන්ම දින සුබ පැතුම් පුද කර සිටියේය.

උන්වහන්සේගේ ජන්ම දිනය නිමිත්තෙන් ඊයේ (26) පෙරවරුවේ නාරාහේන්පිට අභයාරාම විහාරස්ථානයට ගිය ජනාධිපතිවරයා නායක හිමියන් බැහැ දැක උන්වහන්සේට නිදුක් නිරෝගී චිර ජීවනය ප්‍රාර්ථනා කළේය.

නාහිමියන්ට ආශිර්වාද පිණිස පැවති දානමය පුණ්‍ය කර්මයට සහභාගී වූ ජනාධිපතිවරයා මහා සංඝරත්නයට දානය පිළිගැන්වීය. කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ මහා නායක ඉත්තෑපානේ ධම්මාලංකාර, අමරපුර ශ්‍රී ධම්මරක්ඛිත නිකායේ මහානායක තිරිකුණාමලේ ආනන්ද, අස්ගිරි පාර්ශ්වයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී නාරම්පනාවේ ආනන්ද ස්වාමීන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නය මේ අවස්ථාවට වැඩම කර සිටියහ.

නීතිඥ අජිත් රෝහණ ජ්‍යෙෂ්ඨ පොලිස් මාධ්‍ය ප්‍රකාශක ධුරයට

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා ජ්‍යෙෂ්ඨ පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා ලෙස පත් කර ඇති බව පොලිස් මූලස්ථානය සඳහන් කරයි. පොලිස්පති සී.ඩී. වික්‍රමරත්න මහතා විසින් ඔහු මේ තනතුරට පත් කර ඇත්තේ අජිත් රෝහණ මහතා දරන අපරාධ හා රථ වාහන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුරට අමතරවය. ඔහු මීට පෙර අවස්ථා කීපයක දී ද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා ලෙස කටයුතු කළේය. එහෙත් පොලිස් මාධ්‍ය කොට්ඨාසයේ අධ්‍යක්ෂ සහ මාධ්‍ය ප්‍රකාශකවරයා ලෙස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නීතිඥ නිහාල් තල්දූව මහතා කටයුතු කරන බව පොලිස් මූලස්ථානය සඳහන් කරයි.



HDFC වාර්ෂික වාර්තාවට
ලෝකඩ සම්මානයක්

වමේ සිට CA Sri Lanka ප්‍රධාන විධායක නිලධාරි දුලානි ප්‍රනාන්දු, උප සභාපති සංජය බණ්ඩාර සහ HDFC බැංකුවේ සභාපතිනි වසන්ති මංචනායක, ප්‍රධාන මෙහෙයුම් නිලධාරි ඒ.පේ. අතුකෝරල, ප්‍රධාන මූල්‍ය නිලධාරි එච්.ඒ. අනුර මහත්ම මහත්මිහු

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA Sri Lanka) විසින් සංවිධාන කරන ලද කීර්තිමත් වාර්ෂික වාර්තා සම්මාන උළෙළේදී HDFC බැංකුව රාජ්‍ය බැංකු කාණ්ඩයේ ලෝකඩ සම්මානය දිනා ගත්තේය. CA සම්මානය විනිවිදභාවය, ආයතනික පාලනය, තිරසරභාවය සහ සමාජ වගකීම් ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රසිද්ධ වී ඇති අතර, එමඟින් මූල්‍ය හා මූල්‍ය නොවන තොරතුරු ඵලදායි ලෙස සන්නිවේදනය කිරීමත්, නීතිමය අවශ්‍යතා සහ පිළිගත් ගිණුම්කරණ භාවිතයන් පිළිබඳ අවධානය යොමු කර ඇත. මේ සම්මානය HDFC බැංකුවේ වාර්තාකරණ සහ නිවැරැදි සන්නිවේදනයත් යහපත් ආයතනික පාලනය පිළිබඳ අගය කිරීමකි. HDFC බැංකුව ග්‍රාමීය සහ අඩු ආදායමිලාභී ජනතාවගේ සමාජ ආර්ථික තත්ත්වයන් සවිබල ගැන්වීම සඳහා විශාල දායකත්වයක් දී ඇති අතර, නිවාස මූල්‍ය පහසුකම් හරහා ස්ථීර නවාතැන් බලාපොරොත්තු වන්නන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට විශාල වශයෙන් සහාය වී ඇත.

HDFC බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරි පාලිත ගමගේ මහතා මේ පිළිබඳ අදහස් දක්වමින් කියා සිටියේ බැංකුවේ ස්ථාවරත්වය පිළිබඳ තැන්පත්කරුවන් තුළ ඇති විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීමටත්, තොරතුරුවල විශ්වසනීයත්වය පිළිබඳ කොටස් හිමියන් තබා ඇති විශ්වාසය ඉහළ නැංවීමටත් මේ සම්මානය ඉමහත් දායකත්වයක් දෙන බවයි. උත්සවය සංවිධාන කිරීම සහ කරන ලද ඇගයීම පිළිබඳ ඔහු වරලත් ගණකාධිකාරී ආයතනයට ස්තුති කළේය. HDFC බැංකුවට නිවාස අංශයේ දශක තුනකට වැඩි පලපුරුද්දක් සහ විශේෂඥතාවක් ඇත. එහි මූලික ව්‍යාපාරය වන්නේ අඩු සහ මධ්‍යම ආදායම් ලබන කොටස් සඳහා නිවාස ණය ලබාදීමයි. HDFC බැංකුව නිවාස මූල්‍ය පහසුකම් දීමට අමතරව ලීසිං, තැන්පතු, ව්‍යාපාර ණය, අධ්‍යාපනික ණය, රන් ණය, ඉතුරුම් සහ තැන්පතු සඳහා විවිධ සැලසුම් හඳුන්වා දී ඇත.

හොරම්පැල්ල හෙළ වෙද නිකේතනයේ
අත්පොත් තැබීමේ උලෙළ ඉරිදා

මිනුවන්ගොඩ, කලවාන පාරේ (හස්තිවනාරාම පාර) බුළුගහමුල්ල,හොරම්පැල්ල හෙළ වෙද නිකේතනයේ අත්පොත් තැබීමේ උලෙළ මේ මස 30 වැනිදා පෙ.ව 8.00ට ආරම්භ කෙරේ.

මෙහිදී හෙළ වෙදකම සරලව, කර්මාභ්‍යාස සහිතව පුහුණු කෙරෙන අතර සර්වාංග, කැඩුම් බිඳුම්, සර්ප විෂ, ජ්‍යොතිෂය, භූත විද්‍යාව,අංගම්පොර,යෝග,ගුප්ත හා නිල වෙදකම පුහුණු කෙරේ. පාඨමාලා සම්බන්ධීකරණය එල්.බී. චන්ද්‍රලාල්ගෙනි. මිනුවන්ගොඩ සිට වේයන්ගොඩ පාරේ කිලෝමීටර් 2 ක් ගිය විට මේ ස්ථානයට ළඟා විය හැකිය.

කාගිල්ස් ඔන්ලයින් LANKAQR සමග එක් වූ පළමු e-commerce සේවාව බවට පත්වේ

කාගිල්ස් ඔන්ලයින් LANKAPQR සමග එක් වූ පළමු ඉලෙක්ට්‍රොනික වාණිජ වේදිකාව බවට පත්වේ

කාගිල්ස් ඔන්ලයින් ඩිජිටල් ගෙවීම් සඳහා LANKAQR සමග එක් වෙයි

කාගිල්ස් ඔන්ලයින්, සිය පාරිභෝගිකයන්ට ලබා දෙන සේවා පහසුකම් වඩාත් වැඩිදියුණු කරමින් ගෙවීම් සඳහා LANKAQR සමග එක් වූ ශ්‍රී ලංකාවේ ප්‍රථම සහ දැනට පවතින එකම ඉලෙක්ට්‍රොනික වාණිජ්‍ය වේදිකාව බවට පත්ව වෙයි. LANKAQR යනු ශ්‍රී ලංකාවේ සියලුම QR කේත සහ QR කේත පදනම් කරගත් ගනුදෙනු ප්‍රමිතිගත සහ අන්තර් ක්‍රියාකාරී බව සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දියත් කරන ලද ව්‍යාපෘතියකි.

කෙතරම් අවස්ථාවන් ගණනක් අපි අන්තර්ජාලයෙන් ඇතැවුම් කරන සිල්ලර වෙළෙඳ භාණ්ඩ අපිට නොලැබී තිබෙනවා ද? මෙම ගැටලුව විසඳීම සඳහා කාගිල්ස් ඔන්ලයින්, dark store සංකල්පය හඳුන්වා දෙමින් ශ්‍රී ලංකාවේ සිල්ලර වෙළෙඳ භාණ්ඩ සැපයුම් දමයේ විප්ලවීය වෙනසක් ඇති කරන ලදී. කාගිල්ස් ඔන්ලයින් විසින් නැවුම් නිෂ්පාදන පෙළක් පිරිනමන අතර, පාරිභෝගිකයින්ට අවශ්‍ය සිල්ලර භාණ්ඩ මිනිත්තු 2කට අඩු කාලයකින් පහසුවෙන් ඇණවුම් කර, කිසිදු අපහසුතාවයකින් තොරව ගෙන්වා ගැනීමේ හැකියාව පවතී. පළපුරුදු බෙදහැරීමේ නියෝජිතයන් භාණ්ඩ බෙදහැරීමේ කාර්යය ඉතාමත් කාර්යක්ෂමව සිදු කරනු ලැබේ. සෑම විටම පාරිභෝගිකයන්ට ඉහළම සේවාවක් ලබා දීමට පාරිභෝගික සේවා කණ්ඩායම කටයුතු කරයි. LANKAQR සේවා පහසුකමට අමතරව, භාණ්ඩ ලැබුණු පසු මුදල් හෝ කාඩ්පත් මගින් ගෙවීමේ පහසුකම සහ ඔන්ලයින් ක්‍රමයට ගෙවීමේ පහසුකමද කාගිල්ස් ඔන්ලයින් විසින් සලස්වා දී තිබේ. කාගිල්ස් ඔන්ලයින් වෙත ඇන්ඩ්‍රොයිඩ් සහ iOS දුරකථනයන් හි ඇති යෙදුම (app) හරහා සහ https://cargillsonline.com/ වෙබ් අඩවිය හරහා ප්‍රවේශ විය හැක. පාරිභෝගිකයින්ට ජංගම දුරකථන යෙදුම භාවිතා කර හෝ වෙබ් අඩවියට පිවිස ගෙවීම් ක්‍රමය ලෙස LANKAQR තෝරාගත හැක. කාගිල්ස් කණ්ඩායම ඇණවුම ලබා දෙන අවස්ථාවේදී, පාරිභෝගිකයන්ට LANKAQR භාවිතයෙන් ගෙවීම් කිරීමට ඕනෑම ගෙවීමේ යෙදුමක් (payment app) භාවිතා කළ හැක. ගෙවීම් ක්‍රමය ලෙස Card On Delivery හෝ Cash On Delivery තෝරාගෙන තිබුනත්, භාණ්ඩ ලැබුණු පසු පාරිභෝගිකයන්ට LANKAQR හරහා ගෙවීමේ පහසුකම පවතී.

මේ සම්බන්ධයෙන් සිය අදහස් දක්වමින් යෞවන හා ක්‍රීඩා අමාත්‍ය, සංවර්ධන සම්බන්ධීකරණ සහ අධීක්ෂණ අමාත්‍ය සහ ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය, ගරු නාමල් රාජපක්ෂ මහතා ප්‍රකාශ කරන ලද්දේ "මේ වන විට අප සිටින්නේ නවීන තාක්ෂණය යොදාගනිමින් ශ්‍රී ලංකාව තුළ මූල්‍ය අන්තර්ගතය වැඩි කර, ආර්ථිකය ශක්තිමත් කර, සමෘද්ධිය කරා ගෙන යාමට උත්සාහ දරන විප්ලවීය අවධියක. මෙම ජාතික ප්‍රයත්නයට අපට සහාය වීමට කාගිල්ස් සිලෝන් ආයතනය ඉදිරිපත් වීම ගැන මම සතුටට පත් වනවා. LANKAQR යනු ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ LankaClear හි සහයෝගය ඇතිව අප විසින් ගොඩනැගූ සංකල්පයක්. මෙහි විශේෂත්වය වන්නේ LANKAQR සම්පූර්ණයෙන්ම ගොඩනගා තිබෙන්නේ ශ්‍රී ලාංකික විශේෂඥයින්ගේ දැනුම උපයෝගී කරගෙන වීමයි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතා අදහස් දක්වමින්, "ශ්‍රී ලංකා මහ බැංකුව LankaClear සමඟ එක් වී LANKAQR හඳුන්වා දෙන ලද්දේ ශ්‍රී ලංකාව මුදල් නෝට්ටු භාවිතය අවම කරන සමාජයක් බවට පත් කිරීම සඳහායි. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් රටේ සංවර්ධනයේ උත්පාදකයන් වන අතර, ඔවුන්ගේ උපරිම සාර්ථකත්වය ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය සියලු සම්පත් සහ සහයෝගය ඔවුන්ට ලබා දීම අපට වැදගත් වේ. මෙම තාක්ෂණය දිවයින පුරා විසිරී සිටින විශාල පාරිභෝගික පිරිසක් වෙත ගෙන යාමට අප සමඟ අත්වැල් බැඳගත් කාගිල්ස් සිලෝන් ආයතනයට මම ස්තුතිවන්ත වෙනවා."

කාගිල්ස් ෆුඩ්ස් කම්පණි ප්‍රයිවට් ලිමිටඩ් හි කළමනාකාර අධ්‍යක්ෂ අශෝක පීරිස් මහතා සිය අදහස් දක්වමින් ප්‍රකාශ කරන ලද්දේ, "ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන රටාව වැඩිදියුණු කිරීම සඳහා කාගිල්ස් හි අඛණ්ඩ කැපවීම හේතුවෙන් අපි කාගිල්ස් ඔන්ලයින් හඳුන්වා දෙනු ලැබුවා. මෙම හඳුන්වාදීම තුළින් පාරිභෝගිකයින්ට නිවසේ සිටම අවශ්‍ය භාණ්ඩ මිලදී ගනිමින් සුපිරි වෙළඳසලක අත්දැකීම් ලබා ගැනීමට හැකි වූවා. LANKAQR සමඟ එක් වීමෙන් අපගේ පාරිභෝගිකයින්ට ඔවුන්ගේ භාණ්ඩ සඳහා ගෙවීම් සිදු කිරීම වඩාත් පහසු වනු ඇත. බෙදා හැරීම සඳහා LANKAQR සමඟ එක් වූ ශ්‍රී ලංකාවේ පළමු සහ දැනට එකම ඉලෙක්ට්‍රොනික වාණිජ වේදිකාව වීම ගැන අපි ආඩම්බර වනවා."

ශ්‍රී ලංකාව මුදල් නෝට්ටු භාවිතය අවම කරන සමාජයක් බවට පත් කිරීමට සහ රට පුරා මූල්‍ය අන්තර්ගතය වැඩි කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව, LankaClear ආයතන සහ බලපත්‍රලාභී මූල්‍ය ආයතන සමඟ එක්ව LANKAQR හඳුන්වා දෙන ලදී. LANKAQR මගින් පාරිභෝගිකයිනට ඔවුන්ගේ බැංකු ගිණුම් වලින් සෘජුවම LANKAQR සහතික ලත් මූල්‍ය ආයතනවල ගෙවීම් යෙදුම් (payment app) භාවිතා කරමින් වෙළඳුන් හෝ සේවා සපයන්නන්ගේ ගිණුම් වෙත ගෙවීම් කිරීමට ඉඩ සලසයි. LANKAQR යනු කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් මූලික වශයෙන් ඉලක්ක කරගත් අඩු වියදම් ඩිජිටල් ගෙවීම් විසඳුමකි.

සියපත ෆිනෑන්ස් පීඑල්සී
නව ප්‍රධාන ශාඛා පරිශ්‍රයකට

16 වසරකට අධික කාලයක් මුළුල්ලේ, තම දීප ව්‍යාප්ත ශාඛා ජාලය ඔස්සේ හෘදාංගම වූ පාරිභෝගික කේන්ද්‍රීය සේවාවක් සපයමින් ශ්‍රී ලාංකිකයන්ගේ විශ්වාසය දිනාගත් මෙරට ප්‍රමුඛ පෙළේ මූල්‍ය සමාගමක් සහ සම්පත් බැංකු සමූහයට අයත් විශාලතම අනුබද්ධිත ආයතනය වන සියපත ෆිනෑන්ස් පීඑල්සී, සිය අසමසම පාරිභෝගික මෙහෙවර තවදුරටත් පුළුල් කිරීමේ අරමුණෙන් පසුගියදා නව ප්‍රධාන ශාඛා ගොඩනැගිල්ලකට පිවිසෙන ලදී. කොළඹ නගරයේ, ඉක්මනින් හා පහසුවෙන් ළඟාවිය හැකි මධ්‍යගත පිහිටීමකින් යුතු අංක 111, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08 ලිපිනයේ පිහිටි අති නවීන තාක්ෂණික පහසුකම් හා නවතම විශේෂාංග රැසකින් සමන්විත මහල් 13 ක නව ගොඩනැගිලි පරිශ්‍රයේ සියපත ෆිනෑන්ස් ප්‍රධාන ශාඛා කාර්යාලය දැන් ක්‍රියාත්මකය වේ.

සියපත ෆිනෑන්ස් ආයතනයේ නව ප්‍රධාන ශාඛා කාර්යාල පරිශ්‍රය ගනුදෙනුකාර හවතුන්ගේ මූල්‍ය අවශ්‍යතා සහ ආයතනික පාර්ශ්වකරුවන්ගේ කටයුතු වඩාත් කාර්යක්ෂමව ඉටුකර ගැනීමෙහිලා මහාව සැලසුම් කරන ලද වටපිටාවකින් සමන්විතය. ගනුදෙනුකාර හවතුන්ගේ වාහන නැවැත්වීමේ පහසුව උදෙසා වැඩි ඉඩකඩකින් යුතුව සකස් කරන ලද රථශාල, ආයතනික කාර්ය මණ්ඩලයේ පුහුණු හා සංවර්ධන කටයුතු උදෙසා වෙන් කළ අතිනවීන පහසුකම් වලින් සමන්විත දේශන ශාලාව සියපත ෆිනෑන්ස් පීඑල්සී නව ප්‍රධාන ශාඛා ගොඩනැගිල්ලේ පිහිටි වඩාත් කැපී පෙනෙන විශේෂාංග වේ . ඒ ඒ ක්ෂේත්‍රයන්හි පලපුරුදු වෘත්තීයවේදී කාර්ය මණ්ඩලය විසින් ලබාදෙන උපරිම සුරක්ෂිතතාවය තහවුරු කළ නව්‍යකරණයෙන් හා නම්‍යශීලීත්වයෙන් යුක්ත ගුණාත්මක පාරිභෝගික සේවාවන් ආයතනික පාර්ශ්වකරුවන් වෙත ලබාදී ඇති වටිනාකමත් – සාමාජීය වගකීම් නිසිලෙස ඉටුකරනු ලබන පරමාදර්ශී ව්‍යාපාර මෙහෙවරක් සියපත ෆිනෑන්ස් පීඑල්සී නව ගොඩනැගිලි පරිශ්‍රයත් සමඟ තවදුරටත් ශක්තිමත්ව ඇත.

සියපත ෆිනෑන්ස් පීඑල්සී නව ප්‍රධාන ශාඛා ගොඩනැගිල්ල විවෘත කරමින් අදහස් දක්වූ එහි කළමනාකාර අධ්‍යක්ෂ ආනන්ද සෙනෙවිරත්න මහතා "අලුත් ප්‍රධාන ශාඛා කාර්යාල පරිශ්‍රයත් සමඟ අලුත් බලාපොරොත්තුවකින් අලුත් ජවයකින් අලුත් සේවා රැසක් එක්ක සුපුරුදු මූල්‍ය සේවාවන් පවත්වාගෙන යන්නට අප බලාපොරොත්තු වෙනවා. ඕනෑම ප්‍රදේශයක සිට කොළඹ නගරයට සමීප වීමේදී කාටත් පහසුවෙන් ළඟාවිය හැකි ස්ථානයකට අප දැන් පැමිණ සිටිනවා.

අති නවීන පහසුකම් රැසක්, උසස් තාක්ෂණික වටපිටාවක් සහිත මෙම නව ගොඩනැගිල්ල ශ්‍රී ලාංකීය මූල්‍ය සේවා සපයන ආයතන අතර සියපත ෆිනෑන්ස් පීඑල්සී ගොඩනගාගෙන තිබෙන ප්‍රමුඛ පෙළ ප්‍රතිරූපය තවදුරටත් ඉහළ නංවනවා." යැයි පැවසීය.